ප්‍රථම ශාස්ත්‍ර ( බාහිර ) උපාධි විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව

2016.09.18

පෙ. ව. **8.30-12.30**

# ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය

# අ.වි.ප්‍ර 1.2




දේශක :- සරත් කටුකුරුන්ද

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලය

# ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය(අ.වි.ප්‍ර 1.2)

ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය යන මෙම විෂය ඒකකය මගින් ශ්‍රී ලංකාව පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍යයන්ට යටත් වීමට පෙර මෙරට දේශීය සමජ ආර්ථික ක්‍රමයේ මූලික ලක්ෂණ මෙන්ම ඉහත බටහිර ජාතීන්ට යටත් වීම තුල ශ්‍රී ලංකා ආර්ථිකයේ ආර්ථික සමාජීය හා දේශපාලනික වශයෙන් ඇති වූ වෙනස්කම් හා එහි ප්‍රතිඵල පිළිබඳව මූලික අවධානයක් යොමු කරනු ලැබේ.

**මෙහි දී අවධානයට ලක් කෙරෙන අධ්‍යයන ක්ෂේත්‍ර** පහත ආකාර වේ.

- 16 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ පැවති දේශීය සමාජ ආර්ථික ලක්ෂණ.
- පෘතුගීසි පාලනය යටතේ දේශීය ආර්ථිකයේ සිදුවූ වෙනස්කම්.
- ලන්දේසි පාලනය යටතේ දේශීය ආර්ථිකයේ සිදුවූ වෙනස්කම්.
- 1796-1833 දක්වා බ්‍රිතාන්‍යයන් යටතේ සිදු වූ සමාජ ආර්ථික වෙනස්වීම්.
- 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ.
- ශ්‍රී ලංකාවේ වතු වගා ව්‍යාපාරයේ ආරම්භය ව්‍යාප්තිය හා අවසානය.
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය.
- බටහිර ජාතීන් යටතේ ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන ප්‍රතිපත්තිය.

**ඉහත පාඩම් ඒකක අධ්‍යයනය කිරීම මගින් සිසුන් පහත නිපුණතා වර්ධනය කරගනු ඇත.**

- බටහිර ජාතීන්ට නතුවීමට පෙර ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ හදුනා ගැනීමට හා විස්තර කිරීමට හැකියාව ලබා ගැනීම.
- පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන තන්ත්‍ර යටතේ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ සමාජ ආර්ථික පරිවර්ථන හදුනා ගැනීමට හැකියාව ලබා ගැනීම.
- කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදුවූ වෙනස්කම් පිළිබඳව අවබෝධ කරගැනීම හා ඒවා වර්ථමාන සංසිද්ධීන් සමග ගලපා ගැනීමට නිපුණතාව ලබා ගැනීම.
- වතුවගා ව්‍යාපාරයන් සමග ශ්‍රී ලංකා ආර්ථිකය බාහිරට විවෘත වීම හා බොහෝ බාහිර කම්පනයන් ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය පිළිබඳව අවබෝධ කර ගැනීමට හැකියාව ලැබීම.
- වර්ෂ 150 ක් පමණ කාලයක් තුල ක්‍රියාත්මක වූ යටත් විජිත අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලංකා සමාජය කෙරෙහි ඇති කළ බලපෑම් හඳුනා ගන්නා අතරම වර්ථමාන අධ්‍යාපන ක්‍රමයේ දක්නට ලැබෙන විවිධ ප්‍රභලතා මෙන්ම දුබලතා වලටද හේතු වූ සාදක බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමය මගින්ම ජනිත කරනු ලැබූ බව අවබෝධ කර ගැනීම.

# ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයේ නූතන යුගය

## 1. හැඳින්වීම

දේශපාලන ඉතිහාසඥයින්ගේ දෘෂ්ටිකෝණයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයේ නූතන යුගය බටහිර ජාතීන්ගේ පාලනය පටන් ගැනීමත් සමගම ආරම්භ වූ බව සැලකුවද ආර්ථික ඉතිහාසඥයින් එය ආකාරයෙන්ම පිළි නොගනී. ශ්‍රී ලංකාව පෘතුගීසි හා ලන්දේසි පාලනයට නතු වුවද ඔවුන් පැවති පාලන විධිය ප්‍රධාන වෙනස්කම් සිදු නොකට පවත්වා ගෙන යාමට උත්සුක වී ඇත.මූලික වශයෙන් කොල්ලකාරී, ආක්‍රමණකාරී පිළිවෙතක් අනුගමනය කල පෘතුගීසින් යටතේ රටේ ආර්ථික සංවර්ධනයක් නොවීය.ලන්දේසින් යටතේ වූ මුහුදු බඩ පෙදෙස්වල කුරුඳු, කෝපි, පොල් හා ගම්මිරිස් යම් ප්‍රමාණයක් වාණිජ පදනමෙන් වගා කෙරුණද ආර්ථිකයේ මූලික වෙනසක් ලන්දේසින්ද ඇති කලේ නැත.පැරණි වැඩවසම් ක්‍රමය ඒ ආකාරයෙන්ම පැවතුණි.මේ අනුව 1505-1796 පාලන සමය තුල යුරෝපීය බලවතුන්ගේ බලපෑම් ලංකාව කෙරෙහි බල පවත්වන නමුදු ආර්ථික ඉතිහාසය අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය මධ්‍යකාලීන යුගයෙහි ලා පැවති බව සැලකිය හැකිය.

1798 දී බ්‍රිතාන්‍යයින් විසින් ලන්දේසිහු බලයෙන් පහකොට දමනු ලැබූ අතර ඔවුන්ගේ පාලනයේ මුල් වර්ෂ කිහිපය තුල දී පෙර සිටි පාලකයින් මෙන් ආදායම් එකතු කිරීමටත් අයබදු රැස්කිරීමටත් මූලික අවධානය යොමු කොට තිබුණි.මූලික වශයෙන් ඔවුන් පාලන ක්‍රමය පිළිබද වෙනස්කම් ප්‍රධාන වශයෙන් ඉලක්ක කලද රාජ්‍ය ප්‍රතිපත්ති පරමාර්ථ හා ආර්ථික ප්‍රතිපත්ති වල වෙනස්කම් නොකිරීමට වග බලා ගන්නා ලදී.

1815 දි බ්‍රිතාන්‍ය පාලනය මුළු දිවයිනම ආවරණය වුව ද 19 වැනි සියවසේ තුන්වන දශකය දක්වාත් ලංකාවේ ආර්ථික ක්‍රමය මූලික වශයෙන් වැඩවසම් ක්‍රමයක් ලෙස පැවතුණි. ඇත්ත වශයෙන්ම ලංකා ඉතිහාසයේ නූතන යුගය ඇරඹෙන්නේ බ්‍රිතාන්‍යයන්ගෙනි.වඩාත් නිවැරදිව දැක්වුවහොත් කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණ වලිනි.කැමරන්ම දක්වා ඇති පරිදි "යුරෝපීය ශිෂ්ටාචාරයේ බීජ රෝපණය කිරීමට සුදුසුම තැන" වශයෙන් යටත් විජිත පාලකයන් විසින් සලකන ලද්දේ ලංකාවය. මෙම පසුබිම යටතේ ලංකා ආර්ථික ක්‍රමයට වැවිලි කර්මාන්තය හඳුන්වාදීම විප්ලවයක ස්වරූපය ගත්තේය.1832 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වාණිජ ආර්ථිකයට අවශ්‍ය පසුබිම සකස් කළේය.වැවිලි කර්මාන්තයත් සමග ලංකා අර්ථ ක්‍රමයේ මෙතෙක් නොදක්නා ලද අංග රාශියක් හඳුන්වා දෙනු ලැබීය. මේ සමගම ලංකා ආර්ථික ඉතිහාසයේ නූතන යුගය ආරම්භ විය.

බ්‍රිතාන්‍යයන් විසින් වෙළඳ භෝග කර්මාන්තය ස්ථාපිත කිරීමත් සමග එතෙක් ජනතාව විසින් සම්ප්‍රදායානුකූලව පවත්වා ගෙන ආ ජීවනෝපාය මාර්ග වෙනස් වී ගියේය. විශේෂයෙන්ම කෝපි කර්මාන්තය දියුණුවීමත් සමග ඉතා සෙමෙන් වුවද ක්‍රමක්‍රමයෙන් අළුත් ආර්ථික පදනමක් බිහිවිය.නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඉඩම්, ශ්‍රමය හා ධනය යන දේ නව මුහුණුවරක් අනුව සැකසිණි. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉතා ඉක්මනින් ඉදිවිය. වරායවල් ඉක්මනින් සකස් විය. දේශපාලන ප්‍රශ්න නව මුහුණුවරක් ගනු ලැබීය.

එසේම ලංකාවේ මුදල් අර්ථ ක්‍රමයක් ආරම්භ විය. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය ලාභ, වේතන, පොලී හා ණය යනා දී ධනවාදී අංග මත පදනම් විය.ආර්ථික අවපාත, පරිහානි අත්දකින්ට විය.මෙම නව්‍ය බලවේගයන් විසින් මෙරට ස්ථාවරව තිබූ ආර්ථික පදනම බිදහෙලන ලදී. ඒ අනුව අළුත් ශිෂ්ටාචාරයක් බිහිවිය.19 වන සියවස පුරා ක්‍රමක්‍රමයෙන් මෙම ශිෂ්ටාචාරය වර්ධනය විය.මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1875 වන විට නිසැකයෙන්ම ධනවාදය මෙරට මුල්බැස ගෙන තිබුණි.(Ceylon Blue Book)

## 2. 1833 දක්වා බ්‍රිතාන්‍ය පාලනය සහ ලංකාවේ ආර්ථිකය

### i. ගැමි ආර්ථිකය, කෘෂිකර්මාන්තය සහ ඉඩම් භුක්ති ක්‍රමය

බ්‍රිතාන්‍යයින් ලංකාවේ මුහුදුබඩ හා උඩරට ප්‍රදේශවල තම බලය ව්‍යාප්ත කළ කාල සීමාවේ දී (19 වන සියවස ආරම්භයේ) මෙරට ගැමි ආර්ථිකය ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික ජීවන රටාවක් මත පදනම් වී තිබුණි. එහිදී මහජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය කුඹුරු හා හේන් ගොවිතැන වටා ඒකරාශී වී තිබුණි. වියළි කලාපයේ වගා කටයුතු වලදී යම් කන්නයක දී වැවේ නඩත්තුවට අවශ්‍ය සේවාවන් ඉටු නොකරනු ලබන පුද්ගලයකු වේ නම් ඔහුට ඊලඟ කන්නයට තම වගා කටයුතු සඳහා වැවේ ජලය ලබා ගැනීමේ අයිතිය අහෝසි කරනු ලැබුණි. ගමේ වැව සහ ඒ හා සම්බන්ධ වාරිමාර්ග ආදිය මනාව පවත්වාගෙන යාමට මෙන්ම කුඹුරු හා හේන් ගොවිතැනද නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය සේවාවන් ගමරාලගේ නායකත්වය යටතේ සකස් වී තිබුණි. තවද වැව් දුර්ලබ උඩරට හා නිරිතදිග ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු වැසි ජලය මත පදනම්ව සිදු කෙරුනු ගැමි සමාජයකින් සමන්විතව පැවතුණි. සාමූහිකත්වය හා සමෝපාකාරය පදනම් කරගෙන ගැමියන්ගේ විවිධ ආර්ථික හා සමාජ කටයුතු සකස් වී තිබුණි. කුඹුරු හා හේන් එකම යායක් ලෙස වගා කිරීම, වැව් හා ඇලවල් නඩත්තු කිරීම ගොවීන් පොදු වගකීමක් ලෙස සැලකීම, වගා කටයුතු එකම ක්‍රමයකට එකම කාලසීමාවක දී ක්‍රියාත්මක කිරීම සහ අතිරේක ශ්‍රම අවශ්‍යතා වලදී අත්තම් ක්‍රමය හෝ කය්ය ක්‍රමය යටතේ ඒවා සම්පාදනය කර ගැනීම ඒ සඳහා නිදර්ශන කිහිපයකි. ගැමියන්ගේ අවශ්‍යතාවයන් සංකීර්ණ නොවූ අතර මූලික වශයෙන්ම ගැමි ආර්ථිකය යැපුම් ආර්ථිකයක් ලෙස ක්‍රියාත්මක විය. විවිධ භාණ්ඩ හා සේවා කුල ක්‍රමය මත පදනම්ව නිශ්පාදනය වූ අතර ද්‍රව්‍ය හුවමාරු හෙවත් බාටා ක්‍රමයක් මත ගණුදෙනු කටයුතු සිදුවිය.

ගැමි ආර්ථිකය වඩා ශක්තිමත් වූ ලංකාවේ ප්‍රධාන ජීවන වෘත්තිය ගොවිතැන වටා සංකේන්ද්‍රණය වී තිබුණි. ජනතාවගේ ප්‍රධාන ආහාරය බත් වූ නිසා ප්‍රධාන තැනක් හිමි වීම පමණක් නොව වඩා ප්‍රචලිතව ක්‍රියාත්මක වූ එකක් විය. රටේ ඉඩම් භුක්ති ක්‍රමය වී වගා කරන ලද ඉඩම් පදනම් කරගෙන ක්‍රියාත්මක වූ එකක් විය. රජතුමා රටේ සියළුම ඉඩම් වල හිමිකරු යන්න පිළිගත් සම්ප්‍රදායක් විය. ඉඩම් භුක්ති ක්‍රමය ඒ හා සමගාමී විය.

19 වන සියවස මුල දී මෙරට භුක්තිය පැරණි සිංහල ඉඩම් භුක්ති ක්‍රමය අනුව සකස් වී තිබුණි. කුඹුරු ඉඩම් වෙනුවෙන් රජුට කල යුතු සේවාවන් අනුව උඩරට ප්‍රදේශවල ඉඩම් භුක්තිය පුළුල් වශයෙන් කොටස් කිහිපයකි. එනම් ගබඩා ගම්, නින්ද ගම්, විහාර ගම්, දේවාල ගම්, නිදහස් ගම් සහ කෝරාළ ගම් වශයෙනි.

බ්‍රිතාන්‍ය පාලනයට නතු වීමත් සමග 1833 දක්වා ගැමි ආර්ථිකය හා කෘෂිකර්මය කවර වෙනස්කම් ගනුලැබුවේ ද යන්න විමසා බැලිය හැකිය. සහල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල් අඩුකිරීමට ක්‍රියාමාර්ග ගැනීම මගින් වියදම් අඩු කර ගැනීම සඳහා මෙරට දේශීය වී නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය පියවරගත් බව පැහැදිලිය. නෝර්ත් (1798 - 1805) සහ මෙට්ලන්ඩ් (1805 - 1812) යන ආණ්ඩුකාරවරුන් යටතේ එවැනි උත්සාහයන් දරා ඇත.

- රාජකාරී ක්‍රමය අවලංගු කොට ඉඩම් භුක්තිය ගොවීන්ට පූර්ණ අයිතිය පැවරීමට ක්‍රියාකිරීම
- ගොවීන් මුස්ලිම්වරු සහ හෙට්ටීන්ගෙන් ලබා ගන්නා ණය මුදල් වලට අය කළ හැකි උපරිම පොළිය 12 % ක් ලෙස නියම කිරීම
- ගොවීන්ට ධාන්‍ය බීජ ණයට ලබා දීමේ ක්‍රමයක් ඇති කිරීම
- කෘෂිකාර්මික උපකරණ, රෙදිපිළි හා මුදල් ණයට දීම සහ ඒවා නැවත ධාන්‍යයෙන් ආපසු ගෙවීමට ඉඩ දීම
- ණය ආපසු අයකර ගැනීම සඳහා කලෙක්ටර් නම් නිලධාරියෙකු දැමීම
- දකුණු ඉන්දියාවෙන් ගවයන් ගෙන්වා ගවයන්ගේ හිඟකම මකා දැමීම
- එළදෙනුන් පිටරට යැවීම මෙන්ම මැරීම ද තහනම් කිරීම
- අස්වැන්න වැඩිකරගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීම උදා :- ඉන්දියාවේ ක්‍රියාත්මක වූ පැල සිටුවීමේ හා හොඳ අස්වැන්නක් ලබා දෙන මුතු සම්බා වැනි වී වර්ග හඳුන්වා දීම
- දේශීය ගොවීන්ට බදු සහන ඉඩම් ප්‍රදානය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

ඉහත සඳහන් කල ක්‍රියාමාර්ග ගනු ලැබුව ද ස්වභාවික ආපදාවලට අමතරව බ්‍රිතාන්‍යයින් විසින් වී වගාව ප්‍රමුඛ ව දේශීය කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් ගෙන ගිය උදාසීන ප්‍රතිපත්තිය ගොවිතැන් කටයුතුවල පිරිහීමට හේතු සාධක වී ඇත.

### ii. රාජකාරී ක්‍රමය

ලංකාවේ පැවති වැඩවසම් ක්‍රමය රාජකාරී ක්‍රමය ලෙස හඳුන්වා දිය හැකිය. එය දේශීයව ආර්ථික හා සමාජ ක්‍රමයන්හි වැදගත් තැනක් ගනු ලැබිය. ලංකා රාජ්‍යය තුළ ඉඩම් භුක්ති විඳින්නන් වූ රටවැසියන් ඒ සඳහා රජුට හෝ රාජ්‍යයට කිරීමට බැඳී තිබූ සේවය රාජකාරී ක්‍රමය ලෙස දැක්විය හැකිය. විශේෂයෙන්ම රජතුමා රටේ සියලුම ඉඩම් වල හිමිකරු යන්න පෙර පටන් පිළිගත් සම්ප්‍රදාය තුල මෙම ක්‍රමය ක්‍රියාත්මක විය. රාජකාරී ක්‍රමය ඉඩම් භුක්තිය හා කුල ක්‍රමය මත පදනම් වී තිබුණි. එහි ස්වරූපය තිහිපයකි.

(අ) තමා භුක්ති විඳින ඉඩම් වල අස්වැන්නෙන් යම් ප්‍රතිශතයක් රජුට ගෙවීම

(ආ) රජතුමාට කිසියම් සේවාවක් ඉටුකිරීම

(ඇ) පොදු අවශ්‍යතාවයක් උදෙසා වාර්ෂිකව දින ගණනක් වැඩිහිටි පිරිමින් විසින් කල යුතු සේවාව වශයෙනි.

බ්‍රිතාන්‍යයන්ට යටත් වීමට පෙර මෙරට ක්‍රියාත්මක වූ රාජකාරී ක්‍රමය තමන්ගේ අවශ්‍යතා උදෙසා එනම් තම ආර්ථික අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි වෙනස් කිරීම් අනුව ප්‍රයෝජනයට ගනු ලැබිය. 1833 දී කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන තුරු ක්‍රියාත්මක වූ බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ රාජකාරී ක්‍රමය අහෝසි කළ අවස්ථා මෙන්ම එය නැවත ක්‍රියාත්මක කරනු ලැබූ අවස්ථා ද පවතී.

- 1796 ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පාලනය බාරගත් බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දියනු වෙළඳ සමාගම රාජකාරී ක්‍රමය අවලංගු කිරීම (පොල් ගස්වලින් බදු අය කිරීම) මෙය අසාර්ථක උත්සාහයක් විය.

- 1802 දී නෝර්ත් ආණ්ඩුකාරවරයා රාජකාරී ක්‍රමය අහෝසි කොට බදු අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම
- මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා යටතේ (1805 - 1812) රාජකාරී ක්‍රමය නැවත ස්ථාපිත කිරීම

- 1815 දී අත්සන් කල උඩරට ගිවිසුමට අනුව බ්‍රිතාන්‍යයින් උඩරට ප්‍රදේශවල ක්‍රියාත්මක වූ රාජකාරී සේවා වැනි සම්ප්‍රදායික ක්‍රමයක් රැකගැනීමට පොරොන්දු වුවද 1817 අසාර්ථක කැරැල්ල සමග 1818 නොවැම්බර් 21 දින ප්‍රකාශයෙන් රාජකාරී සේවා සම්බන්ධ වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී. මෙය බොහෝ දුරටම 1802 දී මුහුදු බඩ ප්‍රදේශ සම්බන්ධව නෝර්ත් ආණ්ඩුකාරවරයා ක්‍රියාත්මක කල නීති රීති මාලාවටම සමාන වූ එකකි.
- 1829 සැප්තැම්බර් 21 දින ප්‍රකාශනය මගින් කෝපි, කපු, සීනි, ඇවරිය, අබිං සහ සිල්ක් ආදී වාගවන්හි කම්කරුවන් ලෙස සේවය කල අය අනිවාර්ය රාජකාරී සේවාවලින් නිදහස් කිරීම
- 1832 අප්‍රේල් 04 දින පනවන ලද නීතිය මගින් උඩරට ගබඩාගම්, නින්ද ගම් සහ විහාර ගම් රාජකාරී සේවා හැරුණු විට සෙසු එවැනි රාජකාරී අවලංගු කිරීම.

ඉහත කරුණු ගම්‍ය වන්නේ 19 වන සියවසේ මුල් දශක තුන තුල දී ලංකාවේ මුහුදු බඩ මෙන්ම උඩරට ප්‍රදේශවල විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක වී ඇති බවයි. පැහැදිලි වශයෙන්ම කෝල්බෲක් ඉදිරිපත් කල වාර්තාව මගින් ලංකාවේ රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය මෙන්ම එය ගතික ආර්ථික රටාවකට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමෙහිලා සංරෝධකව ක්‍රියාත්මක වූයේ කෙසේද යන්න පිළිබඳව ද මනාව විග්‍රහ කරයි.

## කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ

19 වන සියවසේ තුන්වන දශකය වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ පරිසරය නව මඟකට ගමන් කිරීමේ ලක්ෂණ පෙන්නුම් කරනු ලැබීය. මේ සඳහා මූලික වශයෙන්ම කෝල්බෲක් - කැමරන් යෝජනා මග පෙන්වීමක් කර ඇත.

- 1829 අප්‍රේල් 11 දින විලියම් මැක්බින් ජෝර්ජ් කෝල්බෲක් මූලිකත්වයෙන් ලංකාවට පැමිණි කොමිසම (අධිකරණ හා නීතිමය කටයුතු - චාර්ල්ස් හේ කැමරන් - 1830 මාර්තු 30) මෙරටේ ආර්ථික, සමාජයීය, ආණ්ඩුක්‍රම, පරිපාලනය, යුධ, ආගමික හා දේශීය සම්පත් යනාදී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය.
- ලංකාවේ පාලනය වෙනුවෙන් මෙතෙක් බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරය දරන ලද වගකීමෙන් නිදහස්වීමේ අවශ්‍යතාවය පෙරදැරිව දිවයිනේ ආදායම් හා වියදම් පරතරය අවම වන අයුරු යෝජනා හා සැලසුම් ලබාගැනීම මෙහි මූලික පරමාර්ථයක් විය.

- නැපෝලියන්ගේ පරාජය වීමත් සමග ප්‍රංශ තර්ජනය අවසන්වීම නිසා ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ආර්ථික වශයෙන් වාසිදායක විජිතයක් ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවයද සාධකයකි.
- කෝල්බෲක් සහ කැමරන් දෙදෙනා ස්වකීය යෝජනා ඉදිරිපත් කිරීමේ දී එම අවධියේ එංගලන්තය තුල ද ප්‍රචලිතව පැවති විවිධ න්‍යායන්ගෙන් ද ආභාසය ලබාගති.
- කෝල්බෲක් සහ කැමරන් යෝජනා පහත ක්ෂේත්‍ර ඔස්සේ සාරාංශ කල හැකිය.

1. ආර්ථිකය පිළිබඳ යෝජනා
2. ආණ්ඩුක්‍රමය හා පරිපාලනය පිළිබඳ ප්‍රතිසංස්කරණ යෝජනා
3. අධිකරණය පිළිබඳ ප්‍රතිසංස්කරණ යෝජනා
4. සිවිල් සේවය හා පරිපාලන ආයතන පිළිබඳ ප්‍රතිසංස්කරණ යෝජනා

## ශ්‍රී ලංකාවේ වැවිලි කෘෂි කර්මාන්තයේ ඉතිහාසය.

**1.** හැදින්වීම

1815 වර්ෂයේ බ්‍රිතාන්‍ය බලය මුළු දිවයිනම තුල පතුරුවනු ලැබුව ද 19 වන සියවසේ තුන්වන දශකය දක්වාම ශ්‍රී ලංකාවේ ආර්ථිකය මූලික වශයෙන්ම වැඩවසම් අර්ථ ක්‍රමයක් ලෙස පැවතුනි. මෙසේ පැවති ලංකා ආර්ථික ක්‍රමය තුලම වැවිලි කර්මාන්තය හදිසියෙන්ම හඳුන්වා දීම විප්ලවයක ස්වරූපයක් ගත් බව වැන්ඩන් ඩ්‍රිරිසන් පවසයි. ශ්‍රී ලංකාවට වැවිලි කෘෂිකර්මය හදිසියෙන්ම හදුන්වා දීමත් සමඟ ආර්ථික ක්‍රමයේ මෙතෙක් නොදක්නා ලද අංශ රාශියක් පැන නැගීම සිදුවිය. ඒ සමගම ලංකා ආර්ථික ඉතිහාසයේ වර්ථමාන යුගය ආරම්භ විය. මේ ආකාරයට ලංකාවේ ඇති වූ වෙළඳ භෝග කර්මාන්තය නිසා ජනතාව විසින් සම්ප්‍රදානුකූලව පවත්වාගෙන ආ ජීවනෝපායමාර්ග ක්‍රමයෙන් කොන්වී යාම සිදු විය. විශේෂයෙන්ම වැවිලි කර්මාන්තය ඇතුලත් නව්‍ය බලවේග විසින් මෙරට ස්ථාවර තිබූ ආර්ථික පදනම බිඳ හෙලීමක් කරන ලදී. ඒ අනුව නව ශිෂ්ටාචාරයන් බිහි වූ අතර 19 වන සියවස පුරා ක්‍රම ක්‍රමයෙන් මෙම ශිෂ්ටාචාරය වර්ධනය විය.

කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන ලද ධනවාදී අර්ථ ක්‍රමයට අවශ්‍ය පදනම සකස් කරනු ලැබුයේ වතු වගාව මාර්ගයෙනි. එහිදි කෝපි කර්මාන්තය වැදගත් වන අතර එහි දියුණුව කොතෙක් වී ද යත් රජයේ ආදායමෙන් තුනෙන් එකක් (1/3) පමණ සැපයිනි. මේ අනුව රජයේ වැඩි සැලකිල්ල ද ඒ කෙරෙහි යොමු විය. ඒ සමඟ ම ඉතාම සෙමින් වුවද ක්‍රමයෙන් අලුත් ආර්ථික පදනමක් නිර්මාණය විය.

- නිෂ්පාදනයේ දි අදාළ කර ගැනු ලැබූ ඉඩම් ශ්‍රමය හා ධනය යන දේවල් නව මුහුණුවරක් අනුව සකස් වීම.
- මහා මාර්ග හා ඉතා ඉක්මනින් ඉදි වීම
- වාරායවල් ඉතා ඉක්මනින් ඉදිවීම
- ලංකාවේ පංති ක්‍රමය ආරම්භ වීම

* ලංකාවේ මුදල් අර්ථ ක්‍රමනයට අවශ්‍ය පදනම සකස් වීම.(භාණ්ඩ මිල ගණන්,ලභ ලැබීම,වේතන,කුලී,ණය ලබා ගැනීම.)

2. ශ්‍රී ලංකාවේ කෝපි වගාව

නව තාක්ෂණය උපයෝගී කොට ගෙන මහා පරිමාණ මට්ටමින් කෝපි වගාව ආරම්භ වූයේ 1833 න් පසු වුවද, ශ්‍රී ලාංකික ගොවීන් තම ගෙවතු වල සුළු භෝගයක් වශයෙන් කෝපි වගා කොට ඇති බව පෙනේ. එහිදී කෝපි වගාව ක්‍රමානුකූලව සිදු නොකරන ලදී. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ කෝපි වගා කිරීම පිළිබඳ නිශ්චිත වකවානු අවිනිශ්චිතය. මේ පිළිබඳ මත දෙකක් පවතින බව පෙනේ.

I. 1690 දී ජාවා දූපතට ලන්දේසි කෝපි හඳුන්වා දුන් බවත්, එම වර්ෂයේ ම ශ්‍රී ලංකාවට ද කෝපි වගාව හඳුන්වා දී ඇත.

II. අරාබි ජාතිකයින් කෝපි ඉන්දියාවට හඳුන්වා දුන් අවස්ථාවේ ශ්‍රී ලංකාවට එය හඳුන්වා දී ඇති බව (ටෙනන්ට් ගේ අදහස )- Tennent, Ceylon පෘතුගීසින් හා ලන්දේසින් පැමිණීමට පෙර සිටම ශ්‍රී ලංකාවේ කෝපි ගස තිබූ බවට ශ්‍රී ලංකික සමාජය තුලින් සාධක සපයයි.

  * කෝපි ගසේ ලා දළු ව්‍යංජන වශයෙන් සකස් කර ගැනීම.
  * කෝපි ගසේ මල් ආගමික කටයුතු සඳහා භාවිතා කර තිබීම.

කෝපි වගාවේ මූලාරම්භය පිළිබඳව ඒකමතික අදහස් නොතිබුණ ද එය වෙළඳ ද්‍රව්‍යයක් ලෙස ශ්‍රී ලංකාවේ වගා කිරීමට අනුබල දී ඇත්තේ ලන්දේසින් විසිනි. ලන්දේසින් කුරුඳු වගාව කෙරෙහි විශාල අවධානයක් යොමු කර තිබූ හෙයින් සහ කෝපි මිල විදේශ වෙළඳපොළ තුලදී මිල පහළ වැටේය යන බිය නිසා ඔවුන් කෝපි වගාව කෙරෙහි විශාල අවධානය යොමු කිරීමත් සිදු නොවූ බව පෙනේ. වර්ෂ 1796 දී ලංකාවේ මුහුදු බඩ පළාත් බ්‍රිතාන්‍යයින් අතට පත්විය.

බ්‍රිතාන්‍යයින් යටතේ ශ්‍රී ලංකාවේ අපනයන පදනම් කර ගත් වතු අර්ථ ක්‍රමයනට පදනම 1833 න් පසු කෝපි වගාව හඳුන්වා දීමත් සමඟම සිදු වූ බව පෙනේ. 1832 ට පෙර බ්‍රිතාන්‍යයින් යටතේ කෝපි වැවීමට ගත් උත්සාහයක් අසාර්ථක වූ අතර එකල කෝපි බොහෝ දුරට වගා කරන ලද්දේ විශාල වතු ලෙස නොව පිටිසර දිළිදු ගොවීන් ජීවත් වන නිවාස අවට සහ මාර්ගාසන්නයන්හිය. බ්‍රිතාන්‍ය පාලනය මුල් අවධියේ දී ලංකාවෙන් පිටරට යවන ලද කොපි ප්‍රමාණයන් පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත කිහිපයක් පහත ආකාර වේ.

| වර්ෂය | රාත්තල් ප්‍රමාණය |
|---|---|
| 1806 | 94500 |
| 1810 | 217500 |
| 1813 | 216500 |

✓ මුළු දිවයිනම බ්‍රිතාන්‍යයින් අතට පත්වීමත් සමඟ ස්ථාවර පාලනයක් ශ්‍රී ලංකාව තුල හඳුනාගත හැකි අතර ඒ සමඟ වෙළඳාම ප්‍රචලිත වීමද කෝපි කර්මාන්තයේ ශිඝ්‍ර ව්‍යාප්තියට බලපෑවේ

1833 න් පසු කෝපි නව තාක්ෂණය භාවිතා කරන මහා පරිමාණ වගාවක් ලෙස ව්‍යාප්ත වීමට පටන් ගති.

හේතු

- වගා කළ බිම් ප්‍රමාණය ඉතා ශිග්‍රයෙන් පුළුල් වී තිබේ.

| වර්ෂය | 1833 | 1836 | 1838 | 1840 | 1841 | 1843 |
|---|---|---|---|---|---|---|
| විකුණු ඉඩම් ප්‍රමාණය අක්කර | 146 | 3920 | 10401 | 42582 | 78686 | 58072 |

- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා දී දශකයක කාල පරිච්ඡේදය තුල (1833-1843) ඉඩම් අක්කර 258,072 පමණ විකුණා ඇත.
- ලාංකික කෝපි සහ අපර දිග ඉන්දියානු කෝපි සඳහා සමාන බදු අයකිරීම (රාත්තලකට පැන්ස 6ක තීරු බද්ද)
- බ්‍රිතාන්‍යය, බෙල්ජියම හා ප්‍රංශය වැනි බටහිර යුරෝපීය රටවල වයින් භාවිතය අඩු වී කෝපි භාවිතය වැඩි වීම සහ මිල ඉහළයාම.
- 1837 දී ජැමෙයිකාවේ කෝපි වගාව පිළිබඳ නවීන අත්දැකීම් ලැබූ අර්.බී. ටයිට්ලර් මෙරට කෝපි වගාවේ යෙදීම.
- බටහිර ඉන්දියානු දූපත් වල කෝපි නිෂ්පාදනය පහළ බැසීම. (ගයනාව,ජැමෙයිකාව,ඩොමිනියාව,වහල් මෙහෙය අහෝසි කිරීම.)

මෙය පහත සංඛ්‍යා සටහන මගින් වඩාත් තහවුරු කරයි.

| පහත වැටීම | වර්ෂය | බටහිර ඉන්දියානු දූපත් | | ලංකාව | |
|---|---|---|---|---|---|
| 47% | 1827 | රාත්තල් 29,418,598 | 82% 98.6% | රාත්තල් 1,792,448 (1/16) | 331% |
| | 1837 | රාත්තල් 15,577,888 | | රාත්තල් 7,756,848 (1/2) | |
| 66% | 1847 | රාත්තල් 5,259,449 | | රාත්තල් 19,475,904 (3.7) | 151% |

- කෝපි සඳහා වෙළඳපොලේ ඉහළ මිල නිසා 1834 කෝපි බුසලකට ගෙවූ මිල (සිලිං 15 පැන්ස 3) මෙන් තුන්ගුණයක මිලක් 1842 දී (සිලිං 15) ලබාගත් අතර මෙම කාලසීමාව තුලදී නිපදවන ලද කෝපි ප්‍රමානය 9 ගුණයකින් ඉහළ ගොස් තිබේ. (The Ceylon Blue Book)
- කෝපි වගාවේ යෙදි සිටි යුරෝපියන්ට යුරෝපීය මූල්‍ය ආයතන වලින් පහසුවෙන් ණය ලබා ගැනිමට හැකිවීම ( 1841-1847 දක්වා කාලය කෝපි උන්මාදය, කෝපි උමතුව පැවති අවධිය වැදගත්ය) මෙහිදි සර් කොලින් කැම්බෙල් ආණ්ඩුකාරවරයා කල ප්‍රකාශය ඉතා වැදලත් වේ කෝපි වගාව සඳහා බ්‍රිතාන්‍යය ජාතිකයන් වාර්ෂිකව යොදන ලද මුදල් සම්භාරය පවුම් 10 000 ඉක්ම වූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේදි ලංකාවෙන් පිටරට පටවන කෝපි ප්‍රමාණය බ්‍රිතාන්‍ය ප්‍රමාණයට සමවේයැයි කැම්බෙල් තක්සෙරු කළේය
- 1840 ගණන් වල මැද භාගයෙන් පසු 1849 දක්වා ශ්‍රී ලංකාවේ කෝපි කර්මාන්තය ගැටලු ( පරිහානිය) කිහිපයකට මුහුණ දුණි. දිගින් දිගටම මිල පහළ යාම.

1. 1844 දි එංගලන්තයට ආනයනය කළ කෝපි වලින් අයකල තිරු බද්ද සම කිරිම
2. බ්‍රිතාන්‍යය වෙළඳපොළට ගලා එන බටහිර ඉන්දියානු කෝපි වල සිදු වූ වර්ධනය
3. 1840 ගණන් වල මුල්භාගයේ ඉහළ මිල යටතේ වගාවට ඉහළ ඉඩම් ප්‍රමාණයක් භාවිත කිරිම තුල නිෂ්පාදනය ඉහළ යාම සහ මිල පහළ බැසිම.
4. 1847-49 වර්ෂවල දි එංගලන්තය මුහුණදුන් ආර්ථික පරිහානිය.
    - ආදායම පහළ යාම.
    - ක්‍රය ශක්තිය පහළ යාම.
5. මිල පහල යාම තුළ ලංකාවට ගලා ආ මුදල් අඩුවීම සහ ලන්ඩන් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගත නොහැකි වීම.
6. වැවිලිකරුවන්ට ණය ලබා ගැනිමට අපහසු විම.
    - විලියම් තොම්සන් 1841 ආරම්භ කළ ලංකා බැංකුව 1847 බිඳ වැටිම
7. වැවිලිකරුවන් මුහුණ පෑ කම්කරු ප්‍රශ්නය 1846න් පසු ඉන්දියාවෙන් සංක්‍රමණය වූ කම්කරු සංඛ්‍යාව පහළ බසින්නට විය
    - කම්කරු වැටුප් ඉහළයාම

| වර්ෂය | ලංකාවට සංක්‍රමණය වූ කම්කරු සංඛ්‍යාව |
|---|---|
| 1840 | 73 401 |
| 1846 | 42 317 |
| 1847 | 46 140 |
| 1848 | 32 172 |
| 1849 | 29 430 |

මේ සඳහා හේතු

- දුෂ්කර ගමනාගමනය
- වතුකරයේ වේතන පැහැර හැරිම
- පහසුකම් අඩුවීම තුළ ලෙඩ රෝග වලට ගොදුරු වීම

8. කෝපි වෙළඳ මධ්‍යස්ථාන කරා යැවීම සහ රැස්කර තබා ගැනිම පිලිබඳ ගැටලු පැන නැගීම

(මාර්ග දුෂ්කරතා, බර බාග සංඛ්‍යාව ප්‍රමාණවත් නොවිම)

9. ස්භාවික අපදාවන් නිසා ඇතිවු බලපෑම
    - වර්ෂාපතනය නිසා මියන්ට ආහාර හිඟවීම නිසා කොපි වතු ආක්‍රමණය කිරිම (හා අනෙකුත් පැලැටි හිඟවිම)
    - මකුණු උවදුර (bug) lecanium coffeae

මකුණු උවදුර නිසා එලදාව පහල බසි අක්කරයකට හොන්ඩර 10-16 වූ ප්‍රමාණය තුනෙන් කොටසකට හෝ ඊට අඩු ප්‍රමාණයකට පහත වැටුණි.

10. පස හා දේශගුණය ගැන නොසලකා 1840 ගණන්වල මුල් කාලයේ සිදුකල වගාව සමෘද්ධිමත් කාලසීමාවේ සිදු කළත් පසුව ගැටලු වලට මුහුණ දිම

ඉඩම් පවා අතහැර දමා ඇත

- 1849 වන විට 1847 අරඹා තිබූ වතු වලින් 10% ක් අත්හැර ඇත.
- ඉහත වර්ෂ කිහිපය තුළ කෝපි වගාව යටතේ වූ ඉඩම් ප්‍රමාණය 25% කින් පහත බැස ඇත.
- වතු ඉතා සුළු මුදල් වලට විකුණා දමා ඇත.

උදා - බදුල්ලේ පවුම් 10,000 කට මිලටගත් වතු දෙකක්ම විකුණා ඇත්තේ පවුම් 350 කටය. හිඳුගල්ලේ පවුම් 10,000 වටිනා ඉඩම් පවුම් 500 කට විකිණීම.

1850 පමණ සිට කෝපි සමෘද්ධියක් ඇතිවීම.

- නිෂ්පාදන පිරිවැය අවම කර ගැනිමට වැවිලිකරුවෝ උත්සුක විම.
- වගාවට අවශ්‍ය ණය පහසුකම් ලබා දීමට මූල්‍ය ආයතන ඉදිරිපත් වීම. (1854 චර්ටර්ඩ් මර්කන්ටයිල් බැංකුව)
- කෝපි වැවිලිකරුවන්ට විදේශීය මුදල් මාරුකර ගැනීම සම්බන්ධව පැවති බාධා ඉවත්වීම.
- මහාමාර්ග සහ ධුමරථ මාර්ග, කුලිකරුවන් ලබාදීම සහ කෝපි වගාවට අවශ්‍ය ඉඩම් ලබාදීම යන අංශවලින් යටත් විජිත රජය උදව් කිරීම.
- වගා කටයුතු සඳහා විද්‍යාත්මක ක්‍රමයක් අනුගමනය කිරීම.
- කෝපි මිල ඉහළයාම.

## 1870 පමණ වන විට කෝපි කාර්මාන්තය අභාවයට යාම.

කෝපි කොල රෝගය ව්‍යාප්ත වීම. (හැමිලියා වැසටැට්රික්ස්)

- කෝපි මිල පහත වැටිම. (1877 න් පසුව)
    - බ්‍රසිලයේ සිට පහත් ගණයේ කෝපි වෙළඳපොලට ඉදිරිපත් වීම.
    - මහා පරිහාණිය නිසා බ්‍රිතාන්‍යයේ ජීවන තත්ත්වය පහළ යාම. (1879-1884)
- මූල්‍ය ආයතන අර්බුදයන්ට මුහුණ දීම.

1883 පමණ වන විට කෝපි යුගයේ අවසානය සනිටුහන් කරනු ලැබූ අතර පසුව තේ, කොකෝවා සහ සිංකෝනා වගා කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම හඳුනා ගත හැකි වේ. පසුව දිවයිනේ රබර් වගාවද ආරම්භ කිරීම තුළින් තනි භෝගයක් වගා කිරීම මගින් ඇති විය හැකි අවදානම අවම කර ගැනිමට උත්සාහ කර තිබේ.

## ශ්‍රී ලංකාවේ තේ වගාව සහ අනෙකුත් භෝග

1879 න් පසු කෝපි මිල පහල බැසීම සහ කොල රෝගය නිසා අස්වැන්න පහල යාම නිසා කෝපි වගාව ලාභදායක නොවිය. වතුකරුවෝ වෙනත් වගා සඳහා යොමු වූහ. ඇතැම් යුරෝපීය වැවිලිකරුවෝ දිවයින අතහැර ගියහ. පසුව 1700ක් පමණ වූ යුරෝපීය වැවිලි කරුවන්ගෙන් 400 දෙනා රට හැර ගොස් ඇත.

කෝපි වැනි ප්‍රධාන භෝගයක් වගා කිරීම මගින් ඉහත සඳහන් ගැටලු වලට මුහුණ දුන් වැවිලි කරුවෝ 1870 න් පසුව ඉතුත් වූ දශකය තුල දි අන්‍ය කෘෂිකාර්මික භෝගයන් වගා කිරීම පිළිබඳව අත්හදා බැලීම් සිදු කරනු ලැබිය. මෙම භෝගයන් වගා කිරීම "නවභෝග යුගය" ලෙස විස්තර කිරිමට යෙදිණි ( 1882- 1895) සිංකෝනා, කොකොවා සහ තේ වගා කිරීම පිළිබඳ අවධානය යොමු වී තිබිණ.

<u>සිංකෝනා වගාව</u>

- කෝපි සමඟ සුළු වශයෙන් වගා කිරිම සිදු කර ඇත.
- මුල් අවධියේ සිංකෝනා සඳහා ලන්ඩන් වෙළද පොලේ හොද මිලක් ලැබුණි.
- 1872 දි අක්කර 500 ක් පමණ සිංකෝනා වගාව සඳහා යොදාගෙන තිබූ අතර 1883 පමණ වන විට අක්කර 65,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.
- වගාව වැඩිවීම නිසා මිල ශීඝ්‍රයෙන් පහළ යාම
- බෙහෙත් සඳහා යොදා ගත් අමුද්‍රව්‍යයන් නිසා ඉල්ලුම සීමා සහිත විය.
- 1880 පමණ වන විට ජාවා වැනි රටවලින් සිංකෝනා විශාල වශයෙන් වෙළද පොලට පැමිණීම
- සියලුම ඉඩම් වල සිංකෝනා වගා කිරිම අපහසු වීම.
- තේ වගාවත් සමඟ සිංකෝනා සඳහා යොදාගත් ඉඩම් ප්‍රමාණය අඩුවීම ( 1902 දි පවුම් 1842 1915 දි පවුම් 88)

<u>කොකෝවා වගාව</u>

- මෙම වගාව ලන්දෙසින් විසින් මුලින්ම හදුන්වා දුන්න ද වතු වගාවක් ලෙස ව්‍යාප්ත කිරිම බ්‍රිතාන්‍ය වැවිලි කරුවන් විසින් සිදු කරනු ලැබීය.
- 1878 දි අක්කර 300 සිට 1885 වන විට කෝකෝවා වගා කරන ඉඩම් ප්‍රමාණය අක්කර 12800 දක්වා ඉහල ගොස් ඇත.

මෙය ද අසාර්ථක වගාවක් වීම සඳහා කරුණු කිහිපයක් බලපාන ලදී.

- පුළුල් වගාවක් ලෙස ව්‍යාප්ත කළ නොහැකි වීම
- ලන්ඩන් වෙළඳපොලේ මිල ප්‍රමාණවත් නොවීම
- නිෂ්පාදන වියදම ඉහල යාම
- 1884 න් පසු "උරණ මකුනන්(හිලෝ පෙලිස් ඇන්ටොනි)" ගසට හානි කිරීම.

තේ වගාව

පේරාදෙණිය උද්‍යානයේ පරිපාලක ත්වේට්ස් මහතා 1840 ගණන් වලදී තේ සහ සිංකෝනා වගා කිරීම පිළිබඳ අත්හදා බැලීම් කර ඇත. මෙහි දී තේ වගාව මධ්‍ය කඳුකරයේ සාර්ථක ලෙස සිදු කළ හැකි බව වැවිලිකරුවන් අවබෝධ කර ගත්හ.

- 1860 ගණන් වලදී මෙරට තේ වගා කිරීමේ උත්සහය සාර්ථක වූ අතර තේ වගා කිරීම සඳහා කෝපි වතු කරුවන් උනන්දු කරනු ලැබිණි.

| වර්ෂය | තේ (අක්කර) | වර්ෂය | තේ (අක්කර) |
|---|---|---|---|
| 1867 | 10 | 1881 | 13500 |
| 1872 | 260 | 1882 | 22000 |
| 1874 | 350 | 1883 | 32000 |
| 1875 | 1080 | 1884 | 70000 |
| 1877 | 2720 | 1885 | 102 000 |
| 1880 | 9274 | 1886 | 1,50,000 |

අරම්භයේ තේ වගාවේ වර්ධනයට බල පෑ බාධක

- කෝපි පරිහානිය තුලින් වැවිලිකරුවන් බංකොලොත් වීම.
- මූල්‍ය ආයතන බිඳ වැටීමත් සමඟ මූල්‍ය සම්පාදනය කර ගැනීම පිලිබඳ ගැටලු
- තේ වගාවට සාපේක්ෂව විශාල මූල ධනයක් අවශ්‍ය වීම.
- ප්‍රමාණවත් අකාරයට තාක්ෂණය දියුණු වී නොතිබීම.
- .තේ වගාවට අවශ්‍ය බීජ වර්ග අවශ්‍ය ප්‍රමාණයට නොලැබීම.
- තේ වගාවට සඳහා ස්ථාවර කම්කරු පිරිසක් අවශ්‍ය වීම.

බ්‍රිතාන්‍ය පාලනය හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

සමස්ත බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ මූලික ලක්ෂණ ග්‍රහණය කර ගැනීමේදී පහත ආකෘතිය වැදගත් වේ.

1.කෝල්බෲක් කොමිෂන් වාර්තාව 1832-1867

2.මෝගන් කමිටු වාර්තාව 1867-1899

3.කන්නන්ගර කමිටු වාර්තාව 1943

මෝගන් කමිටු වාර්තාව

කෝල්බෲක් යෝජනා නිසා මෙරට රජයේ අධ්‍යාපනය බිඳ වැටුණ අතර රටේ අධ්‍යාපනය දියුණුවනවා වෙනුවට පරිහානිය කරා ගමන් කරනු ලැබීය.මෙම පසුබිම තුල 1865 වන විට මෙරටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ දේශිය උගතුන් තුළ කතිකාවක් ගොඩනැගුනු අතර උද්ඝෝෂණද ඇති විය.

1865 දී මුතු කුමාරස්වාමි මහතා විසින් මෙරට අධ්‍යාපනය පිළිබඳ සොයා බැලීමට හා වාර්තා කිරීමට කොමිසමක් පත් කල යුතු බව ව්‍යවස්ථාදායක මණ්ඩලයට යෝජනා කළේය.

ආර්. මෝගන් මහතාගේ සභාපතිත්වයෙන් අධ්‍යාපන කොමිසමක් පත් කරන ලදී.(මෝගන් කමිටුව)

බ්‍රිතාන්‍ය යුගයේ පිළියෙල වූ ප්‍රථම අධ්‍යාපන වාර්තාව ලෙස මෙය දැක්විය හැකිය.

මෙම වාර්තාව සකස් කිරීමේදී එංගලන්තයේ හා ඉන්දියාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබූ වෙනස්කම් ද බලපා ඇත.

- 1858 එංගලන්තයේ නිව්කාසල් කොමිසම. ( හොඳ මූලික අධ්‍යාපනයක් සමාජයේ සියළු දෙනාටම ලැබිය යුතුය)
- 1862 එංගලන්තයේ සංශෝධන නීති. (Revised Code) (පාසල් වල ප්‍රතිඵල අනුව ආධාර දීමේ ක්‍රමය)
- ඉන්දියාවේ ඇතිවූ සමකාලීන අධ්‍යාපනික වෙනස්වීම්. (1854 චාල්ස් වුඩ් සකස් කළ වුඩ් සංදේශය (Wood's Despatch) - අධ්‍යාපනය රජයේ වගකීම බව පිළිගැනීම)
  සමාන්‍ය ජනතාවගේ අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂා විය යුතුය යන බව අවධාරණය කර ඇත.
  ඉංග්‍රීසි භාෂාව සීමා විය යුතු බව.
  අධ්‍යාපන පරිපාලනය සඳහා දෙපාර්තුමේන්තුවක් පිහිටුවිය යුතුබව.

**මෝගන් කමිටු අධ්‍යාපන යෝජනා මාලාව**

1. අධ්‍යාපන පරිපාලනය
2. අධ්‍යාපන මාධ්‍යය
3. කාන්තා අධ්‍යාපනය
4. ආධාර මුදල් දීම
5. යෝජිත පාසල් ක්‍රමය
   - කර්මාන්ත පාසල්
   - ද්විභාෂා පාසල්
   - මධ්‍ය පාසල්
   - කොළඹ ඇකඩමිය
   - ගුරු පුහුණුව

**මෝගන් කමිටු යෝජනා ක්‍රියාත්මක වීම**

- 1896 දී ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තුමේන්තුව පිහිටුවීම.

  ඒකීය අධ්‍යාපන ක්‍රමයකට පදනම දැමීම.

- කොළඹ ඇකඩමිය දියුණු වීම. (විෂයමාලාව පුළුල් වීම නිසා මෙම ආයතනය උසස් විද්‍යාලයකට පත්වීම)
- ස්වභාෂා අධ්‍යාපනය දියුණුවීම.
- පාසල් කටයුතුවල ඇතිවූ ප්‍රගතිය.
  පාඨශාලා පරීක්ෂණ සේවාව ප්‍රතිසංවිධානය, පාසල් පරීක්ෂණ සඳහා දිවයින භූගෝලීය ප්‍රදේශවලට බෙදීම, ගුරුවරුන් වර්ග කිරීම හා ආධාර මුදල් දීමේ නීති සංශෝධනය කිරීම.
- උසස් අධ්‍යාපනයේ දියුණුවක් ඇතිවීම.
  ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තුමේන්තුව මගින් පැවැත්වූ දේශීය කණිෂ්ඨ සහ දේශීය ජ්‍යෙෂ්ඨ විභාග වෙනුවට බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාල මගින් පැවැත්වෙන පරීක්ෂණ ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීම.
- 1896 දී අධ්‍යාපන මණ්ඩලය පත්කිරීම.
- අධ්‍යාපනය සඳහා ප්‍රාදේශීය පළාත් පාලන ආයතන සම්බන්ධ කර ගැනීම.

යටත් විජිත අධ්‍යාපන යෝජනා මත මෝගන් යෝජනා පදනම් වී ඇත. අධ්‍යාපන සංවිධානය ක්‍රමවත් වීමට හා පුළුල් කිරීමට මෝගන් යෝජනා හේතුවුවද අධ්‍යාපන ක්‍රමයේ අරමුණ වූයේ යටත් විජිත අවශ්‍යතාවයන් සපුරාගැනීමය. භාෂා භේදය පදනම් වූ අධ්‍යාපන ක්‍රමය මගින් වරප්‍රසාද ලැබූ පංතියක් බිහිකිරීමට පදනම සපයන ලදී. අධ්‍යාපනය පංති භේදයට මග පාදනු ලැබීය.විෂම පාසල් පද්ධතියක් නිර්මාණය විය. ශාස්ත්‍රීය විෂය මාලාව මත පදනම් වූ යටත් විජිත ආර්ථික ක්‍රමයකට උචිත අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැගීමටද මෝගන් යෝජනා හේතු වී ඇත.

## කොල්බෲක් ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය වර්ෂ දෙදහස් පන්සියයක් පමණ ඈතට යන නමුත් ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්‍රමයට සෘජු ලෙස බල පා ඇත්තේ බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කොට පවත්වා ගෙන ගිය අධ්‍යාපන ක්‍රමයයි. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ආරම්භ කොට ක්‍රියාත්මක කල අධ්‍යාපන ක්‍රමයට පදනම් වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන ප්‍රතිපත්තියයි.

ලෝකයේ සෙසු රටවල දී මෙන්ම ශ්‍රී ලංකාවේදී ද බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ක්‍රමයෙහි කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් හදුනා ගත හැකිය.

- අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන් යටත් විජිත පාලකයන්ගේ බලය හා අවශ්‍යතා මත පදනම් කරමින් ස්වදේශිකයන්ගේ අවශ්‍යතා හා හැගීම් නොසලකා හැරීම.
- පාසල, ජාතික අවශ්‍යතා හා ජාතික සංස්කෘතියෙන් ඈත් කිරීම.
- එංගලන්තයට පක්ෂපාති කුඩා ප්‍රභූ පිරිසක් ස්වදේශිකයන් අතුරින් බිහිකර ගැනීම.
- නූතන අදහස් පැතිරවීමට අධ්‍යාපනය යොදා ගැනීම.
- පාලන ක්‍රමයට අවශ්‍ය පහල මට්ටමේ ලිපිකරුවන්, භාෂා පරිවර්තකයින් වැනි උගතුන් සපයා ගැනීම.
- ක්‍රිස්තියානි ආගම ස්වදේශිකයන් අතර පැතිර වීම

1831 දක්වා බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක කාල පරිච්ඡේදය තුල දී ඉංග්‍රීසි යටත් විජිත රජය ප්‍රතිපත්තියක් වශයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ උනන්දුවක් නොදැක්විය.

- අළුතෙන් අල්ලා ගත් ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීමට කාලය යෙදවීම
- උඩරට ප්‍රදේශයේ බලය අල්ලා ගැනීම මෙන්ම පාරවල් තැනීමට කාලය යෙදවීමට සිදුවීම
- බ්‍රිතාන්‍යයේ පවා මෙකල ජනතාවට අධ්‍යාපනයක් දීමරජයේ වගකීමක් ලෙස නොසැලකීම

මෙම සංරෝධක හමුවේ වුවද ඉහත කාල පරිච්ඡේදය තුළ බ්‍රිතාන්‍ය පාලකයින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධව යම් යම් මැදිහත්වීම් කරන ලද අතර ඒ සඳහා පහත කරුණු හේතුවී ඇත.

- ශ්‍රී ලංකාවේ පාලනය තුල සමහර ආණ්ඩුකාරවරුන්ගේ පෞද්ගලික වුවමනා නිසා අධ්‍යාපනය පිළිබඳ උනන්දුවක් ඇති වීම
- ඉංග්‍රීසීන් පැමිණිමට පෙර ලන්දේසීන් ඇති කල පාසල් ක්‍රමය පිරිහි යන විට අධ්‍යාපන පහසුකම් ඇති කරන ලෙස ඉල්ලා උද්ඝෝෂණ ඇතිවීම
- එංගලන්තයේ ඇති වූ ක්‍රිස්තියානි මිෂනාරී සමාගම්වල පුනරුදය

# 1832 සිට1866 දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

1832 කොල්බෲක් කොමිසමේ යෝජනා පදනම් කරගෙන මෙම කාලසීමාව තුල ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වී ඇත. කොල්බෲක් -කැමරන් දෙදෙනාගෙන් සමන්විත වූ කොල්බෲක් කොමිසමේ ප්‍රධාන කාර්යය වූයේ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය, පරිපාලන ක්‍රමය හා අධිකරණ කටයුතු පරීක්ෂා කොට වාර්තා කිරීමටයි. මෙම කරුණු වලට අමතරව අධ්‍යාපනය පිළිබඳ සොයා බැලීම සඳහා ද කොමසාරිස්වරුන්ට උපදෙස් ලැබී තිබිණි.

කොල්බෲක් කොමිසම විසින් මෙරට පැවති අධ්‍යාපන ආයතන පිළිබඳ විවේචනාත්මක විමසීමක් කොට ඇත. එහිදී විශේෂයෙන්ම රජයේ පාලනය යටතේ පැවති පාසල් පිළිබඳව කොමිසම අසතුට පලකර ඇත. රජයේ පාසල් වල සංවිධානයේ හා පාලනයේ දුර්වලතා ඔවුන්ගේ දැඩි අවධානයට ලක් වී ඇත. බොහෝ රජයේ පාසල් නමට පමණක් පවත්නා ආයතන බව ඔවුහු කියා සිටියහ. මේ සඳහා බලපාන ලද හේතු කිහිපයකි.පාසල් පරිපාලනය එකම පුද්ගලයකු අත පැවතීම, ගුරුවරුන්ගේ අදක්ෂතාවය, සහ ගුරුවරුන් රෙජිස්ට්‍රාර්වරුන් වශයෙන් වැඩ කිරීම නිසාද ඔවුන්ගේ කාර්යය හොඳින් කරගෙන යාමට බාධා වීම ඒ අතර ප්‍රධාන වේ. මෙම දුර්වලතා නිසා රජයේ පාසල් අසාර්ථක වූ අතර කොමිසම විසින් ඒවා අසම්පූර්ණ හා අකාර්යක්ෂම ආයතන ලෙස හඳුනා ගනු ලැබිණි.

එහෙත් මිෂනාරී පාසල් පිළිබඳව කොල්බෲක් කොමිසම සතුට පළ කළේය. ඒ අතරම එකල පැවති බෞද්ධ පාසල් අධ්‍යාපනය ගැන කොමිසම නොසලකා හැරියේය.

**" ස්වදේශිය පූජකවරුන් ඔවුන්ගේ පාසල්වල හා විද්‍යාලයන්හි දුන් අධ්‍යාපනය ගැන යමක් කීමට තරම්වත් වටින්නේ නොවේ"** යැයි කොමිසම හෙළි කර ඇත. සමකාලීන ලිබරල්වාදයේ හා උපයෝගීතාවාදයේ බලපෑමට ලක්වූ කොමසාරිස්වරුන් මුළු මනින්ම අධ්‍යාපනය දෙස බැලුවේ උපයෝගීතාවාදී දෘෂ්ටිකෝණයකින්වීම ඉහත ආකල්පයන්ට හේතු ලෙස හඳුනා ගත හැකිය. ඉංග්‍රිසි අධ්‍යාපනයෙන් ස්වදේශිය ජනතාව ශිෂ්ට කල හැකි යැයි කොමිසම හඳුනා ගනු ලැබිය.

කොල්බෲක් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනා ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් වෙනස්කම් සඳහා මග පෙන්වා ඇත.

- රජයේ සියලුම පාසල් පරිපාලනය සඳහා මධ්‍ය සංවිධානයක් ලෙස "පාසල් කොමිසම" නැමති සංවිධානය ඇති කිරීමට යොජනා කිරීම
- ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීම
- ඉංග්‍රීසි ඉගැනිවීම සඳහා විද්‍යාලයක් කොළඹ පිහිටුවීම
- ක්‍රිස්තියානි මිෂනාරී අධ්‍යාපනයට ආධාර හා අනුබලදීමේ ක්‍රියා මාර්ගයක් කොමිසම විසින් අනුගමනය කිරීම

# පාසල් කොමිසම

ලන්දේසීන්ගේ කාලයේ දක්නට ලැබුණු ස්කොලාකල් කොමිසමට සෑම අතින්ම සමාන කොමිසමක් ලෙස රජයේ සියලුම පාසල් පරිපාලනය සඳහා ඇති කළ පාසල් කොමිසම දැක්විය හැකිය. රජයේ පාසල් පරිපාලනය කිරිමත්, කාර්යක්ෂම පාසල් ක්‍රමයක් ඇති කිරිමට හා අධ්‍යාපන ක්ෂෙත්‍රයේ අවශ්‍ය යයි සිතෙන වැඩ පිළිබඳව ආණ්ඩුකාරවරයාට උපදෙස් දීමත් පාසල් කොමිසමේ ප්‍රධාන අරමුණ විය. ආරම්භයේ පටන්ම පාසල් කොමිසම අසාර්ථක වූ එකක් විය. මේ සඳහා බලපාන ලද හේතු කිහිපයකි.

- පාසල් කොමිසමට පත් වූයේ රජයේ නිලධාරීන් වන අතර ඔවුන්ගේ මූලික වගකීම වූයේ අධ්‍යාපනය නොව තමාට අයත් රාජකාරියයි
- කොමිසමේ සාමාජිකයන් අතර නිරන්තරයෙන්ම පැවති මතභේද
- එංගලන්ත සභාවේ පූජකයන්ට කොමිසමේ සුවිශේෂී තැනක් හිමිවීම පිළිබඳව අනෙකුත් මිෂනාරී සමාගම් විරුද්ධවීම

පාසල් කොමිසම අසාර්ථකවීම නිසා 1841 දී මැකන්සි ආණ්ඩුකාරවරයා විසින් පාසල් කොමිසම විසුරුවා හැර මධ්‍ය පාසල් කොමිසම නමින් අළුත් කොමිසමක් අධ්‍යාපන පරිපාලනය සඳහා ඇති කරන ලදී. මධ්‍ය පාසල් කොමිසමේ කාර්යයන් බොහෝදුරට පාසල් කොමිසමට අයත් කාර්යයන්ට සමාන විය. මෙම කොමිසමේ ප්‍රධාන අරමුණ වූයේ ඉංග්‍රීසි අධ්‍යාපනයේ දියුණුව උදෙසා ක්‍රියා කිරිමයි. මධ්‍යම පාසල් කොමිසම පැවති කාලයේ සිදුවූ අධ්‍යාපන ප්‍රගතිය පහත ක්ෂේත්‍ර ඔස්සේ හඳුනා ගත හැකිය.

- අධ්‍යාපන කටයුතු සඳහා රජයේ ආධාර මුදල් දීමේ ක්‍රමය ආරම්භ වීම
- දේශිය පරීක්ෂණ පැවැත්වීම
- පාසල් සංවිධානය

මධ්‍යම පාසල් කොමිසම යම් යම් ප්‍රගතිශීලී පියවර ක්‍රියාත්මක කරනු ලැබුවද සමස්ථයක් වශයෙන් ගත් කළ එහි අසාර්ථකත්වයන් හඳුනා ගත හැකිය. මධ්‍යම පාසල් කොමිසමේ දක්නට ලැබුණු අකාර්යක්ෂමතාව හා නොසැලකිලිමත්කම එහිදී වඩාත් කැපී පෙනුණි. මෙම තත්ත්වයට හේතු කිහිපයක් බලපා ඇත. එනම් මධ්‍යම පාසල් කොමිසම එකඟතාවයකට නොපැමිණි පිරිසකගෙන් සංයුක්ත වීම, ස්වේච්ඡා සංවිධානයකට රටේ අධ්‍යාපන පරිපාලනය භාරදීම, පාසල් පරීක්ෂා කිරිමට එක් නිළධාරියකු පමණක් කොමිසම සතුවීම යනා දී හේතු එහිදී වඩාත් කැපී පෙනේ.

1832 සිට 1868 දක්වා කාළ පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී වැදගත් ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය.

- ලිබරල්වාදයේ සහ උපයෝගිතාවාදයේ ආභාෂය ලැබූ කොල්බෲක් විශේෂයෙන්ම යටත් විජිතයේ වියදම් අවම කිරීමේ අරමුණ පෙරදැරිව යෝජනා කල අධ්‍යාපන ප්‍රතිපත්ති මෙරට අධ්‍යාපනය කෙරෙහි දැඩි ලෙස බලපෑම

- පහළ ශ්‍රේණි සඳහා ස්වදේශිකයන් බඳවා ගැනීමේ අරමුණින් ඔවුන්ට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබාදීම
- පරිපාලනමය වශයෙන් ඉංග්‍රීසි භාෂාව හා සංස්කෘතිය වැලඳගත් ඉංග්‍රීසීන්ට පක්ෂපාතී කුඩා පංතියක් බිහිකර ගැනීම
- මෙරට ඉංග්‍රීසි පාලනයට තර්ජනයක්ව තිබූ ස්වදේශිය ප්‍රභූ පංතියට තර්ජනයක් විය හැකි තවත් පංතියක් බිහිකර ගැනීම
- මෙරට ස්වභාෂා අධ්‍යාපනය බිඳි වැටීම
- ගුරුවරුන්ට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරිම මගින් ස්වභාෂා අධ්‍යාපනය සඳහා රජයේ ආධාර නතර කර දැමීම
- පාසල් කොමිසමේ සමාජිකත්වය හුදු පූජ්‍ය පක්ෂයට පමණක් සීමා නොකොට රජයේ සේවකයන්ද එහි සාමාජිකයන් වශයෙන් පත් කිරිම
- පාසල් කොමිසම මෙන් මධ්‍ය පාසල් කොමිසම ද අසාර්ථක ආයතනයක් වීම
- ඉංග්‍රීසි විද්‍යාලයක් පිහිටුවීමේ යෝජනාව තරමක් හෝ සාර්ථක වීම

සමස්තයක් වශයෙන් කොල්බෲක් ඉදිරිපත් කළ "ජාතික අධ්‍යාපන ක්‍රමයේ" අරමුණ වූයේ ඉංග්‍රීසි පාලකයන්ගේ පරිපාලන, මූල්‍ය හා දේශපාලන අරමුණු ඉටුකර ගන්නා අධ්‍යාපන ක්‍රමයක් බිහි කිරිමය. එහිදි විශේෂයෙන්ම ඉංග්‍රීසි පාලනයට සහාය දෙන වරප්‍රසාද ලත් කුඩා ප්‍රභූ පංතියක් බිහි කිරිමට ආධාර හා අනුබල ලැබුණි. මෙහි දිගුකාලීන ප්‍රතිඵල වශයෙන් ලාංකික සමාජය ඉංග්‍රීසි උගත් වරප්‍රසාද ලත් කුඩා ප්‍රභූ පංතියක් සහ වරප්‍රසාද නොලත් පොදු ජනතාව යනුවෙන් පංති දෙකකට බෙදීම සිදුවුණි. මෙරට පැවති සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය ද බිඳවැටීමට ලක් විය.